# පුරාණ වැව් ගම්මාන ජනශ්‍රැතියේ ගැමි ගෙදර කරල් පැදුරෙන් හෙළි වූ සමාජ සංස්කෘතික වටිනාකම් පිළිබඳව අධ්‍යනය

(සියඹලෑව ගම්මානය ඇසුරින්)

කේ.ඩී.එම්.එස්.එම්.දිසානායක[1], එස්.පී.එම්.පී.ඩී.සන්ධීර[2], යූ.පී.කේ.එස්. උඩගෙදර[3], කේ.ඩබ්.ඒ.ඒ.එස්.එල්.කරුණාරත්න[4]

පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]shyalika1995@gmail.com, [2]Prabhasandeera@gmail.com, [3]Sanjeewaniudagedara56@gmail.com, [4]Lakmalikarunarathna9@gmail.com

ප්‍රමුඛ පදඃ කරල් පැදුර, අග්ගිස්ස, උළුවස්ස, අහුර

## හැඳින්වීම

පුරාණ ලෝකයේ ගම සංවිධානය විම පූර්ව ඓතිහාසික යුගයේ දී සිදු වූ බව මානවවංශ පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. කෘෂිකර්මාන්තයේ පහසුව සඳහා ගැමියන් වැව් ඉදිකර ගත් අතර ඒ හා බැඳුණු වැව් ගම්මාන සංස්කෘතියක් අපේ පුරාණ ගම්වල දැකිය හැකි විය. නමුත් අද වන විට ප්‍රාථමික මට්ටමෙන් පැවති ගම ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය වෙමින් වර්තමානය වනවිට නාගරීකරණය හමුවේ මානව ජීවන රටාව අතිශය සංකීර්ණ මට්ටමකට අවතීර්ණ වී ඇත. දේශීය වශයෙන් ගත් කල කෘෂිකර්මාන්තය ආහාෂය කරගත් පුරාණ ගැමි ගෙදර සතුව පැවති පැරණි ස්පර්ෂිත හා අස්පර්ෂිත උරුමයන් බොහෝමයක් මේ වනවිට අභාවයට ගොස් ඇති අතර එකල ගැමි ගෙදර පැවතුණු සාම්ප්‍රදායික ලක්ෂණ අදවන විට ක්‍රම ක්‍රමයෙන් වියැකී ගොස් ඇත. අද වනවිට අතීත දැනුම වියැකී ගොස් ඇති අතර ඒවා භාවිතය ද ප්‍රායෝගික මට්ටමින් සිදු නොවේ. එහෙත් ඇතැම්, නුවර කලාවියේ පුරාණ ගම්වල තවමත් අවශේෂ වූ ඉපැරණි ගැමි ගෙදර සතු සාම්ප්‍රදායික ලක්ෂණ කිහිපයක් දැකිය හැකි වේ. අතීතයේ පටන් අනුරාධපුර ප්‍රදේශය වැව් ගම්මාන සංස්කෘතියකට උරුමකම් කියූ අතර ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වුයේ කෘෂිකර්මාන්තයයි. ඒ හා සමඟ ගැමි ගෙදර විශේෂ නිර්මාණයක් බවට කරල් පැදුර පත් වූ අතර එමඟින් නොයෙකුත් සමාජ සංස්කෘතික ලක්ෂණයන් විවරණය කරන්නට විය. වර්තමානය වනවිට ඇතැම් වැව් ගම්මානවල මෙම කරල් පැදුර හා එහි අගයන් ශේෂ වී ඇති ද යන්නත් එහි වටිනාකම් එලෙසම පවතී ද යන්න පිළිබඳ ව හඳුනාගැනීමට දරන ලද උත්සාහයක් වශයෙන් මෙම පර්යේෂණය හඳුන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ අරමුණු ලෙස සාම්ප්‍රදායික ගැමි ගෙදර ස්පර්ෂිත උරුමය හඳුනාගැනීම, සාම්ප්‍රදායික ගැමි ගෙදර හා බැඳුණු කරල් පැදුරේ අස්පර්ෂිත උරුමය හඳුනාගැනීම හා සාම්ප්‍රදායික ගොවිතැන ගැමි ගෙදර කලාත්මක භාවයට බලපා ඇති ආකාරය හඳුනාගැනීම හා නූතන වාණිජකරණය සාම්ප්‍රදායික ගැමි නිවසෙහි කරල් පැදුර කෙරෙහි කෙතරම් දුරට බලපා ඇත් ද යන්න හඳුනාගැනීම ආදිය පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යනය යන ක්‍රම දෙකම භාවිත කළ අතර ක්ෂේත්‍ර අධ්‍යනයේ දී ගම්වැසියන් සමඟ සම්මුඛ

සාකච්ඡා පැවැත්වූ අතර ක්ෂේත්‍ර නොවන අධ්‍යනයේ දී ප්‍රාථමික මූලාශ්‍රයක් වශයෙන් මහින්ද කුමාර දළුපොත මහතාගේ ''වටපිළ'' කෘතිය අධ්‍යනය කරන ලදී. වෙනත් ද්විතික මූලාශ්‍රයක් හඳුනාගැනීමට නොමැත. ඉදිරිපත් කිරීමේ දී ඡායාරූප, සිතියම් ආදිය භාවිත කරයි.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

අතීතයේ පටන් හත්කෝරළයේ වැව් ගම්මානවල ගැමියන් කරල් පැදුර වාසනාවේ සංකේතයක් ලෙස සළකන ලදී. ඔවුන් හොඳින් පැසුණු සරුසාර ගොයම් කරල් අහුරක් තෝරා ගනිමින් ඒවා ගොයම් බට පාමුලින් නෙළා ගනිමින් මෝස්තර රටා යොදමින් කුඩා පැදුරක් හැටියට වියයි. එහි අග්ගිස්සෙන් සාර සොබාවට පිරුණු වී කරල් පමණක් පහළට ඉතිරි වෙයි. නිවසක මෙම කරල් පැදුර දකින ඕනෑම කෙනෙකුගේ හිතේ සතුටක් ඇති වෙයි. නිවසේ තිබෙන අං තට්ටුවේ හෝ දොරකඩ උළුවස්සට ඉහළින් කරල් පැදුර එල්ලා තබන අතර මෙම කරල් පැදුරෙන් බොහෝ සමාජ සංස්කෘතික ලක්ෂණයන් කියවේ. කරල් පැදුර නිසා ගැමි කතුන්ගේ පැදුරු වියීමේ හැකියාව පෙන්වා දෙන අතර ම වැව් ගම්මානයේ ගැමියන්ට සාර වී අස්වැන්නක් ලැබුණු බවත් එයින් කියවේ. මේ නිසා කරල් පැදුර වාසනාවේ සංකේතයක් හැටියට ඔවුන් සළකනු ලැබේ. එපමණක් නොව කරල් පැදුර ගැමි කතුන්ට ලෙංගතුකම්වලට මුල පුරන්න හේතුවක් බවට ද පත් වේ. තම මස්සිනා වෙනම නිවසක් සාදනවිට නෑනා කාටත් හොරා කරල් පැදුරක් වියා ඔහු ගෙට ගෙවැදිනවිට දී එය ත්‍යාගයක් හැටියට පිරිනමයි. එමෙන් ම අලුතෙන් ගෙයක් සාදා ගෙට ගෙවැදිනවිට එම ගෙයි උළුවස්සේ අනිවාර්යයෙන් කරල් පැදුරක් එල්ලනු ලබන්නේ එය නිවසට ආශිර්වාදයක් වන බැවිනි. දෙමාපියන්ට හොරෙන් පෙම් සබඳතාවක් පවත්වන පිරිමි දරුවෙක් ඔහු තමන් සාදාගත් නිවසේ රහසින් පෙම්වතිය වියා දුන් කරල් පැදුර එල්ලා තබයි. එය ඇස ගැටෙන ඔහුගේ දෙමාපියන් එම සම්බන්ධයට අකමැති නම් හිත නොරිදා ඒ බව අඟවන්නේ කරල් පැදුර ඇතුළු කාමරයක එල්ලා තැබීමෙනි. අලුත් නිවසක පදිංචියට පැමිණ එම නිවසේ කුළුඳුල් දරුවා ඉපදුන පසු කිරි අම්මාවරුන්ට පිළිගන්වන දානයෙහි කිරිබතට කරල් පැදුරෙන් වී ඇට අහුරක් දමා පිසීම එකල චාරිත්‍රයක් විය. පැරණි වැව් ගම්මානවල කරල් පැදුර වියීම ගෙවිලියගේ චාරිත්‍රයක් වූ අතර ඇය එය අත්හරින්නේ ඇයට දියණියක් ලැබ ඇය උස්මහත් වූ විටයි. එවිට එම චාරිත්‍රය දැරිවිය විසින් සිදු කරන්නක් බවට පත් වේ.

සියඹලෑව ගම්මානය ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 464 තුලානයේ වැව් ගම්මාන සංස්කෘතියකට හිමිකම් කියයි, ප්‍රධාන ජීවනෝපාය වැව් ජලය පාදකකොට ගත් කෘෂිකර්මාන්තයයි. කරල් පැදුර හා බැඳුනු සාම්ප්‍රදායික සමාජ හා සංස්කෘතිය ගැන අධ්‍යනය කරනවිට එම ගමෙහි පැරණි පුද්ගලයන්ට අනුව මීට වසර තිහකට පමණ පෙරාතුව කුඹුරුවලින් ලැබෙන වී අස්වැන්නෙන් කුඩා කොටසක් නෙළාගෙන කරල් පැදුරක් වියා ගමෙහි පන්සලට පූජා කිරීම සාම්ප්‍රදායික චාරිත්‍රයක් බවට පත් වී ඇත. ඊට අමතරව නිවසක කරල් පැදුරක් එල්ලා තැබීමෙන් එය වාසනාවේ සංකේතයක් ලෙස සළකන අතර ම ගැමි නිවසේ වෙසෙන ගේ කුරුල්ලන්ට ආහාරයක් ලෙස ද වැදගත් වේ. කරල් පැදුරක් නොමැති නිවස ''කුරුල්ලන්ට කන්නවත් වී ඇටයක් නැති ගෙදරක් '' යනුවෙන් හඳුන්වා ඇත. ගමෙහි කරල් පැදුර වියීමට නොහැකි අයට හැකි අය වියා දෙනු ලබයි. කරල් පැදුර වියීමේ රටා දෙකකි. ''හිටි රටා'' හා ''මුල් රටා'' යන හැඩයන් ය. මේ සඳහා ''ගල්ලැහැ'' හෝ ''තුන්හිරියා'' පන් යොදා ගනී. කරල් පැදුරු රටාවල ප්‍රධාන අක්ෂර දෙකකි.

''ය'', ''ස'' ප්‍රධාන වේ.එම අකුරු දෙකෙන් ''යස වැඩක්'' යන්න අරුත් ගැන්වේ. කරල් පැදුරේ පන් වර්ණ ගැන්වීමේ දී විශේෂ ක්‍රමෝපායන් යොදාගෙන තිබේ.රතු, කොළ වර්ණ ප්‍රධාන වේ.

වර්තමානය වනවිට සියඹලෑව ගමෙහි කරල් පැදුර හා බැඳුනු සංස්කෘතික වටිනාකම් වියැකී ගොස් ඇති අතර කරල් පැදුර අරුත් සුන් බිත්ති සැරසිල්ලක් පමණක් ම බවට පත් වී ඇත. ගමෙහි සංවර්ධනය, තාක්ෂනික දියුණුවත් සමඟ කරල් පැදුර හා බැඳුනු සංස්කෘතික වටිනාකම, පාරම්පරික දැනුම වර්තමාන පරපුර අතරින් ගිලිහී ගොස් ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


දළුපොත,එම්.කේ. (2003) වටපිළ: ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.


## සම්මුඛ සාකච්ඡා

කරුණාරත්න, කාරියප්පෙරුම මුදියන්සේලාගේ.(2018.02.03). සියඹලෑව, නෑගම්පහ, අනුරාධපුර දිස්ත්‍රික්කය (අවු.75), ගොවිතැන, අකුරු හැකියාව ඇත.

කුමාරිහාමි, සීදුව මුදියන්සේලාගේ.(2018.02.03).සියඹලෑව , නෑගම්පහ, අනුරාධපුර දිස්ත්‍රික්කය (අවු.80), ගොවිතැන, අකුරු හැකියාව ඇත.

පුංචිමැණිකා, කොණ්ඩසිංහ මූලාචාරිලාගේ.(2018.02.03)සියඹලෑව, නෑගම්පහ, අනුරාධපුර දිස්ත්‍රික්කය (අවු.70), ගොවිතැන, අකුරු හැකියාව ඇත.